# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2036/8 – 2017 සැප්තැම්බර් 11 වැනි සඳුදා – 2017.09.11

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/04/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඩී. එම්. චන්ද්‍රසේන මයා, ''රංගවාප'', ඩී 02 - හොබරියාව, ගිරාඳුරුකෝට්ටේ,

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික


1A – G 26246 – 07 (2017/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිලියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89/එෆ්, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු වෘත්තීය සමිති සබඳතා හා
සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/04/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඩී. එම්. චන්ද්‍රසේන මයා, ''රංගචාප'', ඩී 02 - හොබරියාව, ගිරාඳුරුකෝට්ටේ,

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ඩී. එම්. චන්ද්‍රසේන මහතා මහියංගන ඩිපෝවේ සහකාර කළමණාකාර මුදල් තනතුරෙහි සේවය කළ 2004 මැයි මස 01 වැනි දින සිට 2007 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාලය තුළ සාමූහිකව සිදුකළ රාජකාරි කටයුත්තක් හේතුකොටගෙන ඔහුට පමණක් චෝදනා නගා ඔහුගේ විරෝධතාව නොතකා ඒකපාක්ෂිකව පවත්වන ලද විනය විභාගය මගින් ලබාදී ඇති දඬුවම් හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවී ඇත් ද? යන්න හා එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද ? යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන).

2017 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 – 668

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.